**පළමුවන කියැවීම** දනියෙල් 12:1-3

දනියෙල් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

**"ඔබේ සෙනගගෙන් පොතේ නම් ලියා ඇති සියල්ලන් ගැළවෙන්නේ ඒ කාලයේ දී ය."**

දනියෙල් නම් වූ මට දර්ශනය වූ මිනිසා තව දුරටත් මෙසේ කීවේය: "ඒ කාලයේ දී, නුඹේ සෙනග භාරව සිටින උතුම් අධිපතියා වන මිකායෙල් නැගී සිටින්නේ ය. ඒ කාලය වනාහි, මනුෂ්‍ය ජාතිය ඇතිවූ කාලය පටන් මේ දක්වා කිසි කලෙක නොවූ විරූ විපත්ති කාලයක් වන්නේ ය. එහෙත්, නුඹේ සෙනගගෙන් පොතේ නම් ලියා ඇති සියල්ලන් ගැළවෙන්නේ ඒ කාලයේ දී ය. පොළොවේ ධූලි යට සැතපෙන්නන්ගෙන් බොහෝ දෙනෙක්, සමහරෙක් සදාකාල ජීවනයටත්, සමහරෙක් නින්දාව හා සදාකාල පිළිකුලටත් පිබිද එන්නෝ ය. නුවණැති ජාතියේ නායකයෝ ආකාශයේ දීප්තිය මෙන්ද සෙනග හරි මඟ ගෙන ගිය අය තාරකාවන් මෙන් ද සදාකාලයට ම බැබළෙන්නෝ ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**පිළිතුරු ගීය** ගීතාවලිය 16:5, 8-11

පිළිතුර: සමිඳුනි, අපගේ බලාපොරොත්තුව ඔබ වහන්සේ ය. අප රැක ගත මැනව.

ගීය: සමිඳුනි, මාගේ උරුමය හා ඉරණම ඔබ වහන්සේ ය. ඔබ, ඔබ පමණක් ම මා උරුම කොටස රක්නා සේක.

හිමි තුමන් නිරතුරු මා අබියස තබා ගන්නෙමි. මා දකුණු පස එතුමාණන් වැඩ වසන බැවින් මම නොසැලෙන්නෙමි.

එබැවින් ම සිත උදන් අනයි. මහද ප්‍රීතියෙන් පිනා යන්නේ ය. මා ගත සුරැකි ව ඇත්තේ ය. මන්ද, ඔබ මා පාතාලයෙහි නොරඳවන සේක. ඔබේ දැහැමි තැනැත්තාට ජරාපත් වීමට ඉඩ නොදෙන සේක.

ඔබ මට ජීවන මඟ හෙළි කරන සේක. ඔබ අභිමුවෙහි පිරිපුන් සතුට මට වන්නේ ය. ඔබ දකුණු පස සැප සම්පත් සදහට ම ඇත්තේ ය.

**දෙවන කියැවීම** හෙබ්‍රෙව් 10:11-14, 18

හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද හසුනෙන් ගත් කොටසකි.

**උන් වහන්සේ පවිත්‍ර කරනු ලබන්නන් එකම පූජාවකින් පරිපූර්ණත්වයට ගෙනා සේක.**

තවද හැම පූජකයෙක් ම සිටගෙන, දවස් පතා තේවා ඉටු කරමින්, කිසිකලෙකත් පව් නසාලීමට නොහැකි වූ එම පූජාවන් බොහෝ වර ඔප්පු කරයි. එහෙත් උන් වහන්සේ පව් උදෙසා සදහට ම එකම පූජාවක් ඔප්පු කොට, දෙවියන් වහන්සේගේ දකුණු පස

අසුන් ගත් සේක. එහි උන් වහන්සේ සිය සතුරන් තම පා පුටුව කරනු ලබන තුරු බලා සිටින සේක. මන්ද, උන් වහන්සේ පවිත්‍ර කරනු ලබන්නන් එකම පූජාවකින් පරිපූර්ණත්වයට ගෙනා සේක. කමාව ඇති තැන පාප පූජා ඔප්පු කිරීමක් තවත් නැත.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සාධුකාරය</u>** මතෙව් 24:42-44

ආලේලූයා! ආලේලූයා!
අවදි ව සිටින්න.
ඔබ බලාපොරොත්තු නොවන පැයක දී මනුෂ්‍ය-පුත්‍රයාණෝ වඩින සේක.
ආලේලූයා!

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** මාක් 13:24-32

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"සිවු දිගින් තමන් වහන්සේ තෝරාගත් අය රැස්කරනු ඇත."**

"තවද, ඒ දවස්වලදී දුක් ගාවිනාවලින් පසුව, හිරු මඬල අඳුරු වන්නේය; සඳ මඬල එළිය නොදෙන්නේය. අහසින් තාරකාවෝ පතිත වන්නාහ; අහසේ බලපරාක්‍රමයෝ චංචල වන්නාහ. එකල මනුෂ්‍ය - පුත්‍රයාණන් මහා බලපරාක්‍රමයෙන් හා තේජශ්‍රියෙන් විරාජමානව, වලාකුළු මත වඩිනු ඔව්හු දකිති. එවිට උන්වහන්සේ තම දූතයන් යවා පොළොවේ සීමාන්තයේ පටන් අහසේ සීමාන්තය දක්වා සිවු දිගින් තමන් වහන්සේ තෝරාගත් අය රැස්කරනු ඇත." "අත්තික්කා ගසෙන් පාඩමක් ඉගෙන ගන්න. එහි ළපටි අතු මතු වී කොළ ලියලන කල ගිම්හානය ළඟ බව ඔබ දන්නහුය. එලෙස ම මේ දෙය සිදුවනු ඔබ දකිත්ම, උන්වහන්සේ දොරකඩ ළඟ ම යයි දැනගන්න. සැබවින් ම මම ඔබට කියමි, ඒ සියල්ල සිදුවන තෙක් මේ පරම්පරාව පහව නොයන්නේය. අහසත් පොළොවත් පහව යන්නේය, එහෙත් මාගේ වචනය කිසි ද පහව නොයන්නේම ය." "ඒ දිනය පිළිබඳව හෝ ඒ පැය පිළිබඳව හෝ කිසිවෙක් නොදනිති; ස්වර්ගයෙහි දූතයෝ වත්, පුත්‍රයාණෝ වත් නොදනිති; එය දන්නේ පියාණන් වහන්සේ පමණක් ය"යි ජේසුස් වහන්සේ වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.